# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1936/34 - 2015 ඔක්තෝබර් මස 14 වැනි බදාදා - 2015.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය

**50(1) වගන්තිය යටතේ නියෝගය**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 50(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍ය සරත් ඒකනායක වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියට අදාළ පහත සඳහන් සංශෝධන 2015 ඔක්තෝබර් මස 09 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට මෙයින් නියම කරමි.

***නියෝග***

*අ.* 8(3) උප වගන්තිය - බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ලියාපදිංචි ගාස්තුව - රු. 25,000.00

*ආ.* 10(2) උප වගන්තිය -

i. බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව - රු. 5,000.00

ii. බලපත්‍රලාභියෙකු විසින් තැන්පත් කළ යුතු ඇප මුදල - රු. 100,000.00

*ඇ.* යම් භාණ්ඩයක් උකස් තැබීම සඳහා බඩු උකස්ගන්නෙකු වෙත ඉදිරිපත් කිරීමේදී උකස් කරන්නා විසින් ඉදිරිපත් කළ යුතු ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රයෙහි ඡයා පිටපතක් සෑම බඩු උකස් ගන්නෙකු විසින්ම තම භාරයේ රඳවා තබා ගත යුතුය.

සරත් ඒකනායක,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා
බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 09 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

10 - 1091


1A - PG 2639 — 08 (2015/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*